# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.12.01 පැය 0600 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/2154/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**</u>

**01. ගුවන් අනතුරකින් ගුවන් හමුදා නිලධාරියකු මියයාම- වෙන්නප්පුව පොලිස් වසම.**

2025.11.30 වන දින සවස් කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ ලුණුවිල ප්‍රදේශයේදී ජල ගැලීම් හේතුවෙන් ආපදාවට ලක්ව සිටි මහජනතාව වෙත ආහාරපාන ලබාදීම සඳහා පැමිණි ගුවන් හමුදා නිලධාරින් පිරිසක් සහිත හෙලිකොප්ටර් යානයක් ගිං ගඟට කඩා වැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් හෙලිකොප්ටර් යානයේ සිටි ගුවන් හමුදා නිලධාරින් පස් දෙනෙකු මුදවාගෙන මාරවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව එහි ගුවන් නියමුවරයා ලෙස කටයුතු කළ නිලධාරියා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ යටිගම්මන ප්‍රදේශයේ පදිංචි ගුවන් හමුදා වින් කමාන්ඩර්වරයෙකි.**

මෘත ශරීරය මාරවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සෙසු නිලධාරින් හදිසි ප්‍රතිකාර වලින් පසු රෝහලින් බැහැරව ගොස් ඇත. මාරවිල පොලිසිය සහ ගුවන් හමුදාව වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් - කෝප්පායි පොලිස් වසම.**

2025.11.30 වන දින උදෑසන කාලයේ කෝප්පායි පොලිස් වසමේ තිරුණවේලි හන්දිය ප්‍රදේශයේදී තියුණු ආයුධවලින් පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු යාපනය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට කෝප්පායි පොලිස් ස්ථානයට ලද පණිවුඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ කොකුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පුද්ගලයෙකු සමඟ යතුරු පැදියකින් ගමන් කරමින් සිටියදී තිරුණවේලි හන්දිය ප්‍රදේශයේදී තවත් යතුරු පැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් මාර්ගය හරස් කර තියුණු ආයුධ වලින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. අපරාධය සිදු කළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කෝප්පායි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මනුෂ්‍ය ඝාතනයක් - වෙල්ලාවලි පොලිස් වසම.**

2025.11.29 වන දින රාත්‍රී කාලයේ වෙල්ලාවලි පොලිස් වසමේ කන්නපුරම් ප්‍රදේශයේදී පුද්ගලයෙකුට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කිරීමේ අපරාධයක්

සම්බන්ධයෙන් වෙල්ලාවලි පොලිස් ස්ථානයට මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

විමර්ශන නිලධාරින් විසින් අපරාධයට සම්බන්ධ සැකකරු 2025.11.30 වන දින දහවල් කාලයේදී වෙල්ලාවලි පොලිස් වසමේ කන්නපුරම් ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 21 ක් වන කන්නපුරම් බටහිර , බක්කිඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වෙල්ලාවලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. දිය අනතුරකින් විදෙස් ජාතික කාන්තාවක් බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක කොට්ඨාසය හික්කඩුව.

2025.11.30 වන දින උදෑසන කාලයේදී හික්කඩුව, පනන්ගොඩ වෙරළ තීරයේ දියනෑමට ගිය විදෙස් ජාතික කාන්තාවක් දිය වැලකට හසුවී මුහුදට ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත උප පොලිස් පරීක්ෂක සිරිමල්, පොලිස් කොස්තාපල් 94998 හේමකුමාර හා පොලිස් කොස්තාපල් 96221 දුමින්ද, පොලිස් කොස්තාපල් 102748 දිසානායක යන නිලධාරින් විසින් එම කාන්තාව බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දී ඇත.

**මෙලෙස අනතුරට පත්ව ඇත්තේ වයස අවුරුදු 58 ක පෝලන්ත ජාතික කාන්තාවකි.**

## 05. බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවකු අත්අඩංගුවට - බගවන්තලාව පොලිස් ස්ථානය.

2025.11.30 වන දින සවස් කාලයේ බගවන්තලාව පොලිස් වසමේ කොටියාගලවත්ත ප්‍රදේශයේදී බගවන්තලාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බගවන්තලාව පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - දික්වැල්ල පොලිස් වසම.

2025.11.30 වන දින සවස් කාලයේ දික්වැල්ල පොලිස් වසමේ දික්වැල්ල රත්මලේ මාර්ගයේ කිරිනැලිය ප්‍රදේශයේදී රත්මලේ දෙසට ධාවනය වූ ට්‍රැක්ටර් රථයක් මාර්ගයෙන් ඉවතට පැන පෙරළී රියදුරු එම රථයට යටවී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ රියදුරු තංගල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 72 ක් වූ කෝට්ටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර දික්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - අරලගංවිල පොලිස් වසම.

2025.11.30 වන දින සවස් කාලයේ අරලගංවිල පොලිස් වසමේ ගල්තලාව යාය 05 මාර්ගයේ යාය 05 දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය හරහා වැටී තිබූ ගසක් කපා ඉවත් කිරීමෙන් පසු ඉතිරි වූ දැව කඳක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු අරලගංවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වූ අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අරලගංවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අරලගංවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - මහරගම පොලිස් වසම.

2025.11.30 වන දින සවස් කාලයේ මහරගම පොලිස් වසමේ හයිලෙවල් මාර්ගයේ නාවින්න හන්දිය ප්‍රදේශයේදී හයිලෙවල් මාර්ගයේ සිට වත්තේගෙදර දෙසට ධාවනය වූ යතුරු පැදි දෙකක් එකිනෙක ගැටී මාර්ගයේ පෙරළීගොස් එක් පැදිකරුවෙකු දුරකථන රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පැදිකරුවන් දෙදෙනා කලුබෝවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව එක් පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වූ තලපත්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කලුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**